**ශීර්ෂය 134 - ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයෙහි හා 2 ඡේදයෙහි අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| **ශීර්ෂය** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 236 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව |

## 1.1 විගණන විෂය පථය

ඉහත 1 ඡේදයේ සඳහන් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| **ශීර්ෂය** | **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය** |
|---|---|---|
| 134 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 2015 ජූලි 15 |
| 236 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 2015 ජූනි 26 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 576.25 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 479.31 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.මිලියන 89.71 ක් හා රු.මිලියන 7.23 ක් හෙවත් සියයට 19 ක් හා සියයට 7 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 134 | 473.09 | 383.38 | 89.71 | 19 |
| 236 | 103.16 | 95.93 | 7.23 | 7 |
| **එකතුව** | **576.25** | **479.31** | **96.94** | **17** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

## 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 13401 | 14.00 | 9.20 | 4.0 | 5.35 | 58.0 | 22.96 |
| 23601 | 6.50 | 5.92 | 3.50 | 4.20 | 25.00 | 17.42 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.556,820 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 6000/0000/000/0015/0046/000 | 314,912 |
| රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 6000/0000/000/0015/0116/000 | 241,908 |
| **එකතුව** | | **556,820** |

**2.4 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශීර්ෂය 134 - ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය**

**3.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.600,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 13401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.252,320 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 4 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන නමුත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ආ) වෙනත් රාජ්‍ය ආයතනයකට 2014 සැප්තැම්බර් මාසයේ ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගේ රු.111,056 ක ණය ශේෂය අයකර කර ගැනීමට තිබුණත්, එම ණය ශේෂය අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

**3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

අමාත්‍යාංශයෙහි අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණත්, සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන 2014 ජූලි 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. එසේම අභ්‍යන්තර විගණන ඒකකයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත නොකර කළමනාකරණ සහකාර නිලධාරින් දෙදෙනෙකු අනුයුක්ත කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට අභ්‍යන්තර විගණන ඒකකයේ ක්‍රියාකාරිත්වය දුර්වලවීම හේතුවෙන් එක් අභ්‍යන්තර විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2012 සහ 2013 වර්ෂවලදී අපහරණය කළ යුතු බවට සඳහන් භාණ්ඩ අයිතම 598 ක් විගණිත දිනය වූ 2015 ජූලි 15 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

හිටපු අමාත්‍යවරයෙකු විසින් 2011 වර්ෂයට පෙර රැගෙන ගිය භාණ්ඩ වර්ග 73 ක අයිතම 166 ක් වෙනුවෙන් පොදු 219 දරන රිසිට් පත් 2015 අගෝස්තු 31 දින වන විටත් ලබාගෙන නොතිබුණි.

**3.5 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XXX පරිච්ඡේදයේ 1.4.1 වගන්තිය | | රජයේ නිලධාරියෙකු විසින් පවත්වනු ලැබූ දේශන 04 ක් වෙනුවෙන් රු.40,000 ක් එම නිලධාරියාට ගෙවා තිබුණත්, 2015 අගෝස්තු 31 දින වන විටත් එම ගාස්තු ප්‍රමාණයෙන් රජයේ ගාස්තු අයකර ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. |
| **(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| • මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 3,801,371 | නීතිය බලාත්මක කිරීම, යුක්තිදාමයට සම ප්‍රවේශ වීම හා ශ්‍රී ලංකාවේ සමාජ ඒකාබද්ධතාවය ශක්තිමත් කිරීම පිළිබඳ ව්‍යාපෘතියේ අරමුදල්වලින් 2014 ජූනි 06 දින සිට 2014 ජූලි 17 දින දක්වා ලබා දුන් රු.3,801,371 ක අත්තිකාරම් අදාල කාර්යය නිමවූ වහාම පියවා නොතිබුණි. |
| • මුදල් රෙගුලාසි 685 | 1,800,000 | 2014 ජූලි 19 දින පැවති සරුංගල් උත්සවයේ මාධ්‍ය ආවරණ කටයුතු සඳහා ලංසු කැඳවා නොතිබුණි. |

**(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

-----------------------------

| | | |
|---|---|---|
| 2010 ඔක්තෝබර් 20 දිනැති අංක 12/2003 දරන චක්‍රලේඛයේ (1)II (ආ) ඡේදය | 12,050 | පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරිමේ වැඩ සටහන් සඳහා සහභාගී කරගත් භාෂා පරිවර්තකයින් 07 දෙනෙකුට චක්‍රලේඛයට පටහැනිව රු.5,000 ක් බැගින් අවස්ථා 07 කදී රු.35,000 ක් ගෙවා තිබුණි. |

**(iv) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

---------------------

| | | |
|---|---|---|
| 2011 පෙබරවාරි 21 දිනැති අංක 449 දරන චක්‍රලේඛයේ 2(ඇ) ඡේදය | - | 2013 නොවැම්බර් 01 දින ජාතික සමගියේ මහා සමුළුවේ වැඩ සඳහා බඳවාගත් නිලධාරීන් තුන් දෙනෙකුට අපේක්ෂිත කාර්යභාරය 2013 නොවැම්බර් 18 වන විටත් ලබාදී නොතිබුණි. |

**(v ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

--------------------------------

| | | |
|---|---|---|
| • 8.9.1 මාර්ගොපදේශය | 2,800,000 | 2014 දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටිය ඉදිකිරීම වෙනුවෙන් අදාල ආයතනය සමඟ අමාත්‍යාංශය විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. |
| | 250,000 | සරුංගල් උත්සවයේ සරුංගල් නිර්මාණය සඳහා පුද්ගලික ආයතනයක් හා ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය අතර ගිවිසුමකට එළඹ නොතිබුණි. |
| • 5.4.4 මාර්ගෝපදේශය | 720,000 | සරුංගල් උත්සවයේ මාධ්‍ය ආවරණ කටයුතු සඳහා මුළු ප්‍රතිෂ්ඨාවෙන් සියයට 40 කට සමාන රු.720,000 ක |

අත්තිකාරම් 2014 අගෝස්තු 8 දින ගෙවා තිබුණි.

- 5.4.8 මාර්ගෝපදේශය - දැයට කිරුළ ප්‍රදර්ශනයේ රු.2,800,000 ක කොන්ත්‍රාත්තුව සඳහා රු.140,000 ක් වටිනා කාර්යයසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

**3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-------------------------------**

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී "විවිධත්වයෙන් අලංකෘත ජාතික සමඟියෙහි ජනතා මහා සමුළුව" 2014 අප්‍රේල් 07 දින පවත්වා තිබුණි. එහි සංවිධාන කටයුතු සඳහා අමාත්‍යාංශයෙන් පරිබාහිර පුද්ගලයන් තිදෙනෙකු 2013 නොවැම්බර් 01 දින සිට පූර්ණකාලීනව රු.270,000 ක් ගෙවීමේ පදනමට යොදවාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විධිමත් තෝරාගැනීමේ ක්‍රමවේදයකින් තොරව, මෙම නිලධාරීන් බඳවාගෙන තිබුණු අතර, එම නිලධාරීන් බඳවා ගැනීමෙන් දින 26 කට පසු 2014 නොවැම්බර් 26 දින ජීව දත්ත තොරතුරු ලබාගෙන තිබුණි.

(ii) 2013 දෙසැම්බර් 26 දිනැති අංක PED/RED/01/05/2013/02 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව සමුළුව සංවිධානය කිරීමේ කාර්යය සඳහා මුළු දීමනාව රු.270,000 ක් ගෙවීම අනුමත කර තිබුණද ඊට පටහැනිව 2013 නොවැම්බර් 01 දින සිට 2014 මාර්තු 31 දින දක්වා මාස 05 කට රු.345,000 ක් ගෙවා තිබුණි.

(iii) උක්ත ලිපිය ප්‍රකාරව මහ සමුළුව සංවිධානය කිරීමේ කාර්යය විධිමත්ව අවසන් කර අවසාන වාර්තාව ලබාදීමෙන් අනතුරුව මුළු දීමනාව ගෙවීම කළ යුතු බව දන්වා තිබුණද එම උපදෙස්වලට පටහැනිව මසකට රු.30,000 බැගින් නිලධාරීන් තුන් දෙනෙකුට එකතුව රු.345,000 ක් ගෙවා තිබුණි.

(iv) තවද ඉහත ලිපිය ප්‍රකාරව සමුළුව අවසන් වීමෙන් පසුව විධිමත් පරිදි වාර්තාවක් අදාල සේවකයන් විසින් ඉදිරිපත් කළ යුතු වුවත් 2014 ජූලි 22 දින වන විටත් අමාත්‍යාශය වෙත අවසාන වාර්තාව ලබාදී නොතිබුණි.

(ආ) ජාතික සමගිය සමුළුවේ ඉසව් කළමනාකරණ වැඩසටහන පුද්ගලික ආයතනයක් මගින් ක්‍රියාත්මක කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමුළුවේ ඉසව් කළමනාකරණ කටයුතුවල ‘ෆේස්බුක්’ පිටුවක් නිර්මාණය කිරීම, ලියාපදිංචිය හා අසුන්ගත වීමට අදාල කටයුතු කිරීම වෙනුවෙන් රු.451,600 ක් පුද්ගලික ආයතනයකට ගෙවා තිබුණු නමුදු අමාත්‍යාංශයේ භෞතික හා මානව සම්පත් භාවිතා කර එම කාර්යයන් සාපේක්ෂව අඩු පිරිවැයකින් ඉටුකර ගත හැකිව තිබුණු බව අනාවරණය විය.

(ii) ඉසව් කළමනාකරණයේ එක් කාර්යයක් වූ සමුළුව පිළිබඳ පුවත්පත් දැන්වීම් පළකිරීමට පුද්ගලික සමාගමක් වෙත රු.600,000 ක් 2014 මාර්තු 17 දින ගෙවා තිබුණි. අමාත්‍යාංශය විසින්ද සමුළුව පිළිබඳ පුවත්පත් දැන්වීමක් පළ කිරීමට රු.50,000 ක් වැය කර තිබුණි.

(iii) අමාත්‍යාංශය හා පුද්ගලික සමාගමක් අතර 2014 මාර්තු 7 දින ඇතිකර ගත් ගිවිසුම අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවක් (Technical Appraisal Committee) පත්කර එක් එක් කාර්යයන්හී ප්‍රගතිය පරීක්ෂා කර ගුණත්වය අඩු සේවාවන් වැඩිදියුණු කිරීමට අදාල සමාගමට අවස්ථාවක් ලබාදීම කළ යුතුව තිබුණි. එසේ කමිටුවක් පත්කර එම කාර්යයන්හී ප්‍රගතිය නිරීක්ෂණය කළ බවට වාර්තා විගණනයට ඉදිරිපත් වී නොතිබුණි. සමුළුව නිමවී සති 06 කට පසුව අමාත්‍යාංශයේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ 2014 මැයි 28 දිනැති වාර්තාව අනුව ඉසව් කළමනාකරණ කාර්යයේ පහත සඳහන් අඩුපාඩු පැවති බව වාර්තා කර තිබුණි.

- සමුළුව පැවැත්වීමට පෙර හා සමුළුව පවත්වන කාලයේදී අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදාහැරීම කර නොතිබුණි.
- ගුවන් විදුලි නාලිකා 4 ක් මගින් සමුළුව පිළිබඳව දැනුවත් කළ යුතු වුවත් නාලිකා දෙකක් පමණක් ඒ සඳහා යොදා ගෙන තිබුණි.
- රූපවාහිනී නාලිකා 3 ක් වෙනුවට රූපවාහිනී නාලිකා දෙකක් පමණක් යොදා ගෙන තිබුණි.

**3.7 හානි හා පාඩු**

**-------------**

වර්ෂ 4 කට වැඩි කාලයක සිට පැවැත එන එකතුව රු.1,243,301 ක් වූ හානි හා පාඩු කපා හැරීමට 2015 අගෝස්තු 15 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

**3.8 අනාර්ථික ගනුදෙනු**

**-------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛය ප්‍රකාරව නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කරවා ගත හැකි උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් වුවද, 2010 දෙසැම්බර් 8 දින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ප්‍රාඩෝ වර්ගයේ මෝටර් රථයක්ද, වර්ෂයකට රු.375,000 ක්, රු.275,000 ක් හා රු.180,000 ක් බැගින් (VAT රහිතව) කුලී ගෙවීමේ පදනම මත අමාත්‍යාංශය ලබාගත් වාහන 3 ක්ද නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පරිහරණය සඳහා ලබාදී තිබුණි.

(ආ) 2003 මාර්තු 28 දිනැති අංක එම්එෆ්/ටීර්/1/2003 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය ප්‍රකාරව ගරු අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් නොවන සියලුම පුද්ගලයන්ගේ ප්‍රයෝජනයට ගන්නා වාහන සඳහා ගෙවිය හැකි සියලුම ගාස්තු ඇතුළත් මාසික කුලිය රු.40,000 ක් නොඉක්මවිය යුතු වුවද, නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනයට මාසිකව රු.91,392 ක් බැගින් වාහන පහකට 2014 නොවැම්බර් 30 දිනට තෙමසක කාලයකට රු.1,370,880 ක කුලී පෞද්ගලික සමාගමකට ගෙවා තිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 12 | 11 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 434 | 156 | 278 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 120 | 90 | 30 |
| | එකතුව | 581 | 260 | 321 |

## 4. ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### 4.1 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.215,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

### 4.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 23601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2012 මාර්තු 29 දින විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.83,442 ක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර නොතිබුණි.

(ආ) 2007 අප්‍රේල් 10 දින හා 2013 මාර්තු මාසයේ සිට සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් පිළිවෙලින් අයවිය යුතු රු.3,700 ක සහ රු.74,116 ක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබිණි.

### 4.3 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

#### 4.3.1 අභ්‍යන්තර විගණනය

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් 2014 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-------------------------------------**

2014 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 760 පරිදි කටයුතු කර නොතිබුණි.

**4.5 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**--------------------------------------------**

දෙපාර්තමේන්තුව සතු කැබ් රථයකට 2014 ජනවාරි මාසයේදී සිදුවූ අනතුරකින් රු.361,894 ක අලාභයක් සිදු වී තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාර අලාභහානිය පිළිබඳ පූර්ණ වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**4.6 කාර්යසාධනය**

**-----------------**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණයට 2014 වර්ෂයේදී අපේක්ෂකයින් 48,300 ක් සහභාගී වෙතැයි අපේක්ෂා කර තිබුණද ඊට සහභාගී වූ ගණන 29,360 ක් විය.

(ආ) ස්වයංක්‍රීය භාෂා පරිවර්තන මෘදුකාංගයක් 2014 දෙසැම්බර් 31 දින වනවිටත් ස්ථාපිත කර නොතිබුණි.

(ඇ) නිවැරදි භාෂා භාවිතය පිළිබද පර්යේෂණයක් සිදු කර වැඩමුළුවක් 2014 දෙසැම්බර් 31 දිනටත් පවත්වා නොතිබුණි.

(ඇ) භාෂා ප්‍රවීණතාවය ඇගයීම සඳහා පරිගණකය පාදක කර ගත් විභාග ක්‍රමයක් ස්ථාපිත කිරීම, අභ්‍යන්තර ඇමතුම් පද්ධතියක් සවි කිරීම, බඳවා ගැනීමේ පරිපාටි විශ්ලේෂණය හා සංශෝධනය කිරීම 2014 දෙසැම්බර් 31 දින වන විටත් ඉටු කර නොතිබුණි.

**4.7 කළමනාකරණ දුර්වලතා**

**-------------------------**

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා අනාවරණය විය.

(අ) විද්‍යාපති හා ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවන් හැදෑරීමට ආයතනයේ නිලධාරීන් දෙදෙනකුට රු.315,000 ක සම්පූර්ණ පාඨමාලා ගාස්තුවද තවත් නිලධාරීන් දෙදෙනකුට

රු.75,000 ක් වූ පාඨමාලා ගාස්තුවෙන් අඩක්ද ගෙවා තිබුණි. සේවය හැර යාම හෝ පාඨමාලා අතරමඟ නවතා දැමීම වැනි අවස්ථාවකදී එකී මුදල් අයකර ගැනීම සඳහා වන කොන්දේසි සඳහන් කරමින් නිලධාරීන් සමඟ දෙපාර්තමේන්තුව ගිවිසුමකට ඇතුළත්වීමට 2015 ජනවාරි 15 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව පරිභෝජන භාණ්ඩ මිලදී ගැනීමට ප්‍රතිපාදන සළසා නොතිබූ අතර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අත්තිකාරම් ලබා ගනිමින් ලිපිද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි.

## 4.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 03 | 02 | - |
| (ii) | තෘතියික මට්ටම | 15 | 11 | 04 | - |
| (iii) | ද්විතියික මට්ටම | 212 | 149 | 63 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 10 | 02 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 06 | - | 06 |
| | **එකතුව** | **244** | **179** | **71** | **06** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ තනතුරු 6 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවා ගෙන තිබුණි.